# CONTRIBUTION OF SINHALESE HISTORICAL NOVEL TO NOURISH THE DISCOURSE ON HISTORY

U Alahakoon[1] and HWK Sajeewani[2]

## Abstract

Chronicle literature holds a special place in the discourse on history. Often, the popular discourse on history in society is built on the basis of chronicle literature. However, these chronicles are ideological and therefore sometimes contain biased interpretations. These characteristics can also be seen in the Mahavamsa, the foremost chronicle of Sri Lanka. Therefore, the chroniclebased historical discourse can be considered as an incomplete discourse. The intervention of the historical fiction writer is very useful in minimizing this incompleteness to some extent and in transforming its existing one-dimensional nature into multidimensional. The objective of this study is to compare this popular discourse and the imaginative works attempts to broadened it. Content and thematic analysis methods were used to analyse the data. Five Sinhala novels published in the twenty-first century were selected as a sample. They are novels based on rulers and their reigns that have been demonized in official and popular historical discourse. The characters are Queen Anula, Kashyapa 1, Rajasinghe 1, Rajasinghe 11 and Sri Wickrama Rajasinghe. The novels are Rajina and NI Katrol written by Mohan Raj Madawala and Thiwata, Kandureli and Na Gachchathi written by Padmini Seneviratne. Although these novels are imaginative endeavors, they are not mere fiction. They have to maintain the reality of that fiction. To do this, they have used alternative and obscure sources rather than popular sources. This will provide an opportunity to look at the actions of certain rulers, branded by official history as patricide, from a different perspective and the reasons those known as cruel and tyrannical rulers became such are exposed. Although historical fiction is an imaginative endeavor, its potential to expose history to multiple readings is immense. It can be concluded that the historical novel presents an imaginative alternative to the official, dominant, and popular historical discourse. Also, the historical novel cherish the historical discourse by bringing small narratives to the foreground that are overshadowed by the grand narrative. As a result, blending factual history with imaginative history will enable historical discourse to absorb a greater readership.

***Keywords:*** History, Historical discourse, Historical fiction, Alternative history

---

[1]National Institute of Library and Information Sciences, University of Colombo, Sri Lanka.

Email: uditha@nilis.cmb.ac.lk https://orcid.org/0009-0003-9015-0730

[2]Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka.

Email: kusala@gwu.ac.lk https://orcid.org/0009-0009-7702-176X

Proceeding of the 3rd Desk Research Conference – DRC 2025 © 2025 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 01.09.2025 Accepted date: 15.10.2025

Print Publishing Date: 31.10.2025 Web Publishing Date: 31.10.2025

## ඉතිහාසය කතිකාව පෝෂණයෙහි ලා සිංහල ඓතිහාසික නවකතාවේ දායකත්වය

යූ. අලහකෝන් සහ එච්. ඩබ්ලිව්. කේ. සජීවනී

**සාරාංශය**

ඉතිහාසය පිළිබඳ කතිකාවේ දී වංශකතා සාහිත්‍යයට විශේෂ ස්ථානයක් හිමිවේ. බොහෝ විට සමාජය තුළ ඉතිහාසය පිළිබඳ ජනප්‍රිය කතිකාව ගොඩනැංවෙනුයේ වංශකථා සාහිත්‍ය පදනම් කරගෙනය. එහෙත් මෙම වංශකතා දෘෂ්ටිවාදී වන අතර ඒ හේතුවෙන් ඇතැම්විට පක්ෂග්‍රාහී විවරණවලින්ද යුක්තවේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වංශකතාමය ඉතිහාස මූලාශ්‍රය වන මහාවංසය තුළ ද මෙකී ලක්ෂණ දැකිය හැකිය. එහෙයින් වංශකථා පාදක ඉතිහාස කතිකාව අසම්පූර්ණ කතිකාවකි. මෙම අසම්පූර්ණත්වය යම් පමණකට අවම කිරීමටත් එහි පවත්නා ඒකමානී බව බහුමානී කිරීමටත් ඓතිහාසික ප්‍රබන්ධකරුවාගේ මැදිහත්වීම මහෝපකාරී වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මෙම නිල සහ ජනප්‍රිය කතිකාව සමඟ ඊට අභියෝග කරන පරිකල්පනාත්මක උත්සාහයන් විමසා බැලීමය. මේ සඳහා අන්තර්ගත සහ තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කෙරිණි. නියැදිය ලෙස විසිඑක්වන සියවසේ ප්‍රකාශිත සිංහල නවකතා පහක් තෝරාගන්නා ලදී. ඒවා නිල සහ ජනප්‍රිය ඉතිහාස කතිකාව තුළ දුෂ්ටයන් බවට පත් කළ රාජ්‍ය පාලකයන් සහ ඔවුන්ගේ පාලන සමයන් පාදක කොට රචිත නවකතා වේ. අනුලා ඍ ජින, ෂ කාශ්‍යප, ෂ රාජසිංහ, ෂෂ රාජසිංහ සහ ශ්‍රී වික්‍රම රාජසිංහ එකී චරිත වේ. එම නවකතා වන්නේ මොහාන් රාජ් මඩවල ලියූ ඍජින සහ නිල් කට්රොල් පද්මිනී සෙනවිරත්න ලියූ තීවත, කඳුඇලි සහ න ගච්ඡතිය. මෙම නවකතා පරිකල්පනාත්මක ප්‍රයත්න වුවද ඒවා හුදු ප්‍රබන්ධම නොවන බව පෙනේ. ඔවුනට එම ප්‍රබන්ධයේ යථාර්ථය පවත්වා ගෙන යාමට සිදුවේ. මේ සඳහා ඔවුහු ජනප්‍රිය මූලාශ්‍රවලට වඩා විකල්ප සහ අප්‍රකට මූලාශ්‍ර භාවිත කරති. එවිට පීතෘ ඝාතකයන් ලෙස නිල ඉතිහාසය විසින් හංවඩු ගැසූ ඇතැම් පාලකයන්ගේ ක්‍රියාකලාපය දෙස වෙනස් මානයකින් බැලීමට අවකාශ සැලසේ. දරුණු සහ කෲර පාලකයන් ලෙස ප්‍රකට වූවන් එම තත්ත්වයට පත්වීමට හේතු නිරාවරණය කෙරේ. ඓතිහාසික නවකතාකරණය පරිකල්පනීය වෑයමක් වුවද ඉතිහාසය බහුවිධ කියවීමකට ලක් කිරීමට එමගින් ලැබෙන පිටිවහල අපමණය. ඇතැම් විට ස්වකීය දෘෂ්ටිවාදය තහවුරු කිරීමට ප්‍රබන්ධය යොදා ගැනීමට වංශකථාකරුවන්ට සිදුව තිබේ. මෙයින් නිගමනය කළ හැක්කේ නිල, අධිපති සහ ජනප්‍රිය ඉතිහාස කතිකාවට පරිකල්පනීය විකල්පයක් ඓතිහාසික නවකතාවෙන් ඉදිරිපත් කරන බවය. එමෙන්ම මහා ආඛ්‍යානය මගින් යටපත් වී ඇති චූල ආඛ්‍යාන පෙරබිමට ගැනීමෙන් ඓතිහාසික නවකතාව ඉතිහාස කතිකාව වර්ණවත් කරන බවය. එහි ප්‍රතිඵලයක් ලෙස කරුණුමය ඉතිහාසය පරිකල්පන ඉතිහාසය සමඟ මුසු කිරීමෙන් ඉතිහාස කතිකාව වෙත වැඩි පාඨකත්වයක් අවශෝෂණය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** ඉතිහාසය, ඉතිහාස කතිකාව, ඓතිහාසික ප්‍රබන්ධ, විකල්ප ඉතිහාසය

### හැඳින්වීම

ඉතිහාසය පිළිබඳ කතිකාව මානව ශිෂ්ටාචාරයේ බොහෝ ඈතට දිව යන්නකි. අතීතය සහ ඉතිහාසය අතර පවත්නා සමානතා මෙන්ම අසමානතා ද මෙම කතිකාවේ අවධානයට ලක්ව තිබේ. ඉතිහාසය නම් විෂය පාසල් අධ්‍යාපනයේ සිට දර්ශනසූරී උපාධි දක්වා පරාසයක විහිදී පැවතීම පැහැදිලිව දැකිය හැකි ලක්ෂණයකි. එමෙන්ම ඉතිහාසය හැදෑරීම ස්වකිය විනෝදාංශය කර ගත් පිරිසක් ද සිටිති. මෙලෙස සාමාන්‍ය දැනුමේ සිට ශාස්ත්‍රීය පර්යේෂණ දක්වා පුළුල් ව්‍යාප්තියක් සහිත කලාපයක සැරිසරන විවිධ රුචිකත්ව මට්ටම් නියෝජනය කරන විෂයක් ලෙස ඉතිහාසය හැඳින්විය හැකිය. කෙසේ වෙතත් මෙම ඉතිහාස කතිකාව අතීතයට වඩා වර්තමානයේ දී වඩාත් සංකිර්ණ තලයකට පිවිස ඇත. පර්යේෂණාත්මක මැදිහත්වීම් වර්ධනය වීමත් විවිධ දෘෂ්ටිවාද හා බැඳුණු අර්ථකථනාත්මක ප්‍රවේශය පුළුල් වීමත් මෙම සංකීර්ණතාව තවදුරටත් තීව්‍ර කර තිබේ. මේ නිසා ඉතිහාසය පිළිබඳ විකල්ප කියවීම්වල වැඩිවීමක් ද දක්නට ලැබේ. ශාස්ත්‍රීය ලෝකයේ සිදුවන මෙකී පරිණාමයන් ඉතිහාසය පිළිබඳ ඒකමානී සහ අධිපති දැක්ම, බහුමානී දැක්මක් වෙතට පරිවර්තනය කිරීමට සමත්ව තිබේ.

ඉතිහාසය පිළිබඳ නිර්වචනාත්මක පැහැදිලි කිරීම්වල ද ඒකමිතියක් නොමැත. ඉතිහාසඥයෝ එය එකිනෙකට වෙනස් ආකාරවලින් නිර්වචනය කරති. ඊ. එච්. කාර්ට (1961) අනුව ඉතිහාසය යනු වර්තමානය සහ අතීතය අතර පවත්නා සංවාදයකි. මෙයින් පැහැදිලි වන්නේ ඉතිහාසය යන්නෙන් වියුක්ත ලෙස අතීතය හැදෑරීමක් අදහස් නොවන බවයි. එනම්, සමකාලිකත්වයෙන් මිදුණු ඓතිහාසිකත්වයක් නොපවතින බවයි. මෙම අදහසම ඩී කොලාන්ග්ස් (1954) වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරයි. ඒ අනුව, ''ඉතිහාසය විද්‍යාවකි. එය විද්‍යාවක් විය යුතුය. ඉතිහාසය යනු අතීතයේ සිදු වූ සියලු සිදුවීම් පිළිබඳ තොරතුරු එකතුවක් නොවේ. එය මානව සමාජයන්හි විද්‍යාවයි.'' ඉතිහාසය යනු හුදු කරුණුමය සීමාවෙන් ඔබ්බෙහි පවතින යමක් බව එයින් පැහැදිලි වේ. ඉතිහාසය පිළිබඳ ස්වකීය පැහැදිලි කිරීම ඉදිරිපත් කරන කීත් ජෙන්කින්ස්ට (1995) අනුව එය දෘෂ්ටිවාදී ගොඩ නැගීමකි. ඉතිහාසය, ඉතිහාසය සඳහා ම නොවන බවත් එය හැමවිට ම අනෙකෙකු සඳහා බවත් ඔහු වැඩිදුරටත් පවසයි.

ඉතිහාසය රචනා කිරීම හෙවත් ඉතිහාසවේදය ද මෙම කතිකාවට වැදගත් වේ. ඉතිහාසය ලිවීම ඉතිහාසඥයාගේ කාර්යභාරයයි. මෙම කාර්යයේ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කරන ඊ. එච්. කාර් (1961) පවසනුයේ එය අතීතය සමඟ බැඳීමක් ඇති කර ගැනිම හෝ අතීතයෙන් තමාව නිදහස් කර ගැනීම නොවන බවයි. ඉතිහාස රචනා මුළුමනින්ම කරුණු සහ තොරතුරු මත පදනම් විය යුතු වූවත් ඉතිහාසයට අර්ථකථනයෙන් බැහැරවීම දුෂ්කර වේ. මන්ද සියල්ල

හැමවිටම ඉතිහාසය රචනයේ යෙදෙන ඉතිහාසඥයා ජීවත් වන සමයේ පවතින බල සබඳතා සමඟ සමීපව බැඳෙන බැවිනි. ඉතිහාසය නිමවා ඇත්තේ බලයේ සිටින්නවුන් යැයි මිෂෙල් ෆුකෝ (1980) පවසා ඇත්තේ එනිසාය. එහෙයින් වාස්තවික ඉතිහාසය යනුවෙන් යමක් පවතී ද යන්න සැක සහිතය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉතිහාසයේ සාරය ද අපට දැනගත හැකි වන්නේ නියෝජනයන් ලෙසිනි. වෙනත් ආකාරයකට පවසන්නේ නම්, සත්‍ය හෝ ඓතිහාසික කරුණු පරම ආකාරයෙන් දැන ගැනීමේ හැකියාවක් නොපවතී. එහෙයින් ඉතිහාසඥයාට ද එම පරම ආකාරයට සමීප නියෝජනයක් තෝරා ගැනීමට සිදු වේ. මේ අනුව ඉතිහාසය අර්ථකථනය කෙරෙනුයේ නියෝජනයන්ගේ අර්ථකථන ලෙසය. එවිට ඉතිහාසවේදයට ඉතිහාසඥයාගේ ආත්මීයත්වයෙන් මෙන්ම අපේක්ෂිත හෝ අනපේක්ෂිත විකෘතීන්ගෙන් ද ගැලවීමට අපහසු වේ. ඉතිහාසය ද ප්‍රබන්ධය මෙන් ම හුදු ආඛ්‍යානයක් යැයි ජෙන්කින්ස් (1995) පවසන්නේ එහෙයිනි. මෙලෙස ඉතිහාසය රචනා කිරීමේ ක්‍රියාවලිය තුළට ප්‍රබන්ධය යන වදන ප්‍රථමවරට ඇතුළත් කරන ලද්දේ මිෂෙල් ඩී. සර්ටියු (1988) විසිනි. ඉතිහාසය කරුණුමය තොරතුරු මත පදනම්වන අතර ප්‍රබන්ධය සත්‍ය හා පරිකල්පනය මත පදනම් වේ. මෙම අංශ දෙකට පවත්නේ ද්විමය හෙවත් බයිනරිමය සබඳතාවකි. කෙසේ වෙතත්, ඉතිහාස රචනාවන්නේ පවත්නා දෘෂ්ටිවාදී බවත් අර්ථකථනාත්මක බවත් හේතු කොට ගෙන එම තත්ත්වය ක්‍රමයෙන් වියැකී යමින් පවතී. මේ අනුව ඉතිහාසවේදය තුළ ප්‍රබන්ධයත් ප්‍රබන්ධය තුළ ඉතිහාසවේදයත් වෙන් කර හඳුනාගැනීම අසීරු වන ආකාරය සිතා ගැනීම දුෂ්කර බව රෝලන්ඩ් බාත (1959) ප්‍රකාශ කරයි. එමෙන්ම පුරාවෘත්ත, මිථ්‍යා කතා, ජනශ්‍රැති යනාදිය ද ඉතිහාසවේදය තුළ කැපී පෙනෙන භූමිකාවක් ඉටු කරයි. ඉතිහාසය යනු අප සැවොම විශ්වාස කිරීමට එකඟත්වය පළ කරන මිථ්‍යාවක් යැයි ප්‍රකාශ කරනුයේ එහෙයිනි. (ඊරඑයිල 1981) හයින්රිච් ශ්ලිමාන් නම් පුරාවිද්‍යාඥයා ට්‍රෝයිපුරයේ සුප්‍රකට නටබුන් අනාවරණය කර ගන්නා ලද්දේ හෝමර්ගේ වීරකාව්‍යවල සඳහන් තොරතුරු අනුව වීම මීට නිදසුනකි. යුලිසිස් නම් නූතනවාදී නවකතාව රචනා කළ ජේම්ස් ජොයිස් පවසනුයේ ''ඉතිහාසය යනු මා අවදිවීමට තැත් කරන බියකරු සිහිනයකි '' යනුවෙනි. ඉතිහාසකරණය සහ ප්‍රබන්ධකරණය අවියෝජනීය ප්‍රපංච දෙකක් බව මේ අනුව පැහැදිලි වේ.

වංශකතා වැනි ලිඛිත මූලාශ්‍රවල සහ පුරාවිද්‍යාත්මක සාධකවලට පමණක් ඉතිහාස කතිකාව සම්පූර්ණ කිරිමට හැකියාව නොපවතී. කවර රටක වුව ද ඉතිහාසය යනු අසම්පූර්ණ කතිකාවකි. විශේෂයෙන් ලිඛිත මූලාශ්‍රවල පවත්නා හිඩැස් සහ පක්ෂග්‍රාහී ස්වරූපය මීට ප්‍රධාන වශයෙන් බලපා තිබේ. එහෙයින් ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රීය කතිකාවේ පවත්නා මෙම අඩුව යම්තාක් දුරට පිරවිය හැකි මෙවලමක් ලෙස ප්‍රබන්ධ සාහිත්‍ය හඳුන්වාදිය හැකිය. එය පරිකල්පනීය ව්‍යායාමයක් වුවත් මුළුමනින් ම කරුණුමය ඉතිහාසයෙන් ඛණ්ඩනය නොවේ. මෙහිදී ඓතිහාසික නවකතාව තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ලබයි. මෙම ඓතිහාසික නවකතාව එකිනෙකට වෙනස් ආකාරවලින් නිර්මාණය කෙරේ. මේ අනුව අධිපති ඉතිහාස ප්‍රවාද තහවුරු කරමින් ඉදිරිපත් කරන නවකතා දක්නට ලැබේ. ඇතැම් ඓතිහාසික නවකතා අධිපති ඉතිහාසවේදයේ අසාධාරණයටත් නොසලකාහැරීමටත් ලක් වූ මෙන්ම එමගින් දුෂ්ටයන් බවට පත් කළ චරිත වෙත විකල්ප දැක්මක් යොමු කරයි. තවත් විටෙක ඇතැම් ඓතිහාසික සිදුවීම් වෙනත් දෘෂ්ටිකෝණයකින් සලකා බැලීමට උත්සාහ කරයි. එමෙන් ම ලිඛිත මූලාශ්‍ර විසින් මගහැරගිය කාලවකවානු, සිදුවීම් හෝ අවස්ථා පරිකල්පනාත්මකව සම්පූර්ණ කිරීමේ අභ්‍යාසයක යෙදෙයි. එසේත් නැතහොත් ලිඛිත මූලාශ්‍රවල ඉතාමත් අල්ප වශයෙන් සඳහන්ව ඇති සාමාන්‍ය ජනතාවගේ ජීවන රටාව, ඇවතුම් පැවතුම්, මානව සබඳතා ප්‍රතිනිර්මාණය කිරීමේ මෙහෙයුමක නියැලෙයි. තවද බහුතර සමාජය වෙතට මෙම ඉතිහාසය කතිකාව රැගෙන යාමේ දී ශාස්ත්‍රීය ලේඛනයට වඩා වැඩි විභවතාවක් ඓතිහාසික නවකතාව සතු වේ.

**අධ්‍යයනයේ අරමුණු සහ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ වංශකතාමය මූලාශ්‍ර තුළ සහ අධිපති ඉතිහාස කතිකාව තුළ නිශේධනාත්මක ඇගයීමකට ලක් වූ ප්‍රකට චරිත කිහිපයක් වෙත ඓතිහාසික නවකතා විසින් හෙලා ඇති බැල්ම ඉතිහාස කතිකාව පෝෂණය කිරීමට කරනු ලබන දායකත්වය විවරණය කිරීම වේ. මේ සඳහා 2015 සිට 2023 දක්වා පළ වූ සිංහල ඓතිහාසික නවකතා පහක් (05) විමසුමට ලක් කෙරිණි. පද්මිනී සෙනෙවිරත්නගේ න ගච්ඡති (2016) තිවත (2019), කඳුරැළි (2023) සහ මොහාන් රාජ් මඩවලගේ රැජින (2016) සහ නිල් කට්රොල් (2021) මෙම අධ්‍යයනය සඳහා යොදා ගැණිනි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස තේමාත්මක සහ අන්තගර්ත විශ්ලේෂණය යොදා ගෙන ඇත. මෙම නවකතා අතරින් න ගච්ඡති ශ්‍රී වික්‍රම රාජසිංහ චරිතය ද රැජින අනුලා බිසව ද තිවත ෂ රාජසිංහ ද කඳුරැළි ෂෂ රාජසිංහ ද නිල් කට්රොල් සීගිරි කාශ්‍යප ද තේමා කොට ගෙන නිර්මාණය කර ඇත. මේ අනුව ඉතිහාසය පිළිබඳ ජනප්‍රිය සහ අධිපති කතිකාවත් ප්‍රබන්ධය ඔස්සේ ගොඩ නැංවෙන විකල්ප කතිකාවත් තුලනාත්මකව විමසුමට ලක් කෙරේ.

**විවරණය**

ක්‍රි. පූ. 643 සිට ක්‍රි. ව. 1815 දක්වා, එනම් විජයගේ සිට ශ්‍රී වික්‍රම රාජසිංහ දක්වා අවුරුදු 2358 ක කාලය තුළ රජවරුන් 185 දෙනෙක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයේ නියැලී ඇත. ඒ අතර කාන්තාවන් සිව් දෙනෙකු සිටී. ක්‍රි. පූ. 47 දී රාජ්‍යත්වයට පත් වන අනුලා රැජින එයින් ප්‍රථමයා වේ. ශ්‍රී ලංකාවේ පමණක් නොව ආසියාවේ ද ප්‍රථම රැජින අනුලාය. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වංශකතාව වන මහාවංශයට අනුව අනුලා යනු පාලනය කරගත නොහැකි අධික කාමාශාවකින් පෙළුණු බලය වෙනුවෙන් ඕනෑම පිරිමියෙකු සමඟ යහන්ගත වීමට නොපැකිලෙන ස්ත්‍රියකි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි විසින් සංස්කරණය කරන

ලද මහාවංශ ග්‍රන්ථයෙහි සඳහන් පහත දැක්වෙන ප්‍රකාශය ඊට නිදසුනකි.

> ''එම අනුලා තොමෝ නිලීය නම් දෙමළ බමුණා
> කෙරෙහි රාගයෙන් ඇළුනා, උනු හා සහවාස කැමැත්තී
> ඒ දර කැටි තිස්ස රජු මරවා නිලීය බමුණාට රජය දුන්නාය.''
> (34 පරි., 146 පි., 23-24)

මහාචාර්ය හේමචන්ද්‍ර රායි සංස්කරණය කළ ලංකා ඉතිහාසය කෘතිය ද මේ හා සමාන අදහසක් හුවා දක්වයි.

> ''ලංකා ඉතිහාසයේ පළමුවෙනි රැජින වූ
> අනුලා මුළු ස්ත්‍රී පක්ෂයම නින්දාවට
> ලක් කළාය. එක් සොර සැමියෙකුට
> පසුව තවත් සොර සැමියෙකු මැරූ ඇය
> තම කාමාශාව තෘප්ත කරගනු සඳහා
> අන්තිමේ දී බලතුන් දෙතිස් දෙනෙකු
> ඇතිව සිටි බව කියනු ලැබේ'' (255 පි.)

අනුලා රැජින පිළිබඳ ජනප්‍රිය සහ අධිපති ඉතිහාස කතිකාව විසින් සමාජය තුළ ස්ථාපිත කර ඇත්තේ මෙවන් නිශේධනාත්මක අදහසකි. මොහාන් රාජ් මඩවල සිය රැජින නවකතාවෙන් මෙම අදහස් දෙස විකල්ප ඇසකින් බැලීමට උත්සාහ කරයි. මේ අනුව මහානාග රජු අතින් අනුලාගේ කන්‍යාභාවය විනාශ වනවිට ඇගේ වයස අවුරුදු දහතුනකි. ඇය හුදෙක් වයස්ගත මහානාග රජුගේ ද ලාබාල කුඩා තිස්ස රජුගේ ද ලිංගික තෘප්තිය පිරිමැසූ ස්ත්‍රී ශරීරයකි. ඔවුන් වෙතින් ආදරය නොලද අයෙකි. රැජින කෘතියේ අන්තර්ගත පහත උපුටනය අනුලාගේ පත්ව සිටි තත්ත්වය පැහැදිලි කරයි.

> ''ඇය සිටින්නේ ළපටි ළඳුන් ප්‍රිය කළ
> මහානාග රජුගේත් මැදිවියේ ළඳුන් ප්‍රිය
> කළ කුඩා තිස්ස රජුගේත් සිරියහන්
> ගබඩාවෙන් පිටතය. ඇය ඒ දෙදෙනාගේම
> සල්ලාල මජර පිළිවෙත් දරා ගත නොහැකිව
> සෑම රැයකම කඳුලු වැගිරුවාය. මේ
> දෙදෙනා නිසා ඇය මුළුමහත් පිරිමි සංහතියටම
> වෛර කළාය'' (125 පි.)

ජනප්‍රිය කතිකාවේ දැක්වෙන ආකාරයට මහානාග, කුඩා තිස්ස, වටුක, ශිව, නීලිය යන සැමගේ මරණය ඇගේ කාම පිපාසාවේ ප්‍රතිඵලයකි. එහෙත් නවකතාකරුවා තම ප්‍රබන්ධයේ දී මේවා කටකතා ලෙස විදහා දක්වයි. මේ අනුව අධිපති කතිකාවේ පවත්නා පුරුෂකේන්ද්‍රීය දෘෂ්ටිය නවකතාකරුවා ස්ත්‍රීකේන්ද්‍රීය දෘෂ්ටියක් වෙතට විතැන් කරයි.

I රාජසිංහ හෙවත් සීතාවක රාජසිංහ මෙරට රාජාවලිය තුළ කැපී පෙනෙන තවත් චරිතයකි. අතිශූර රණකාමියෙකු වූ ඔහු පෘතුගීසීන්ට එරෙහිව කළ ජයග්‍රාහී සටන් පිළිබඳ තොරතුරු ඉතිහාස මූලාශ්‍රවල සඳහන් වේ. එහෙත් මහාවංශය පාදක ජනප්‍රිය ඉතිහාස කතිකාව තුළ ඔහු නිරූපණය කර ඇත්තේ කෲර පීතෘඝාතක මුද්‍රාව යටතේය. මායාදුන්නේට රාජසිංහ නමින් ප්‍රසිද්ධ වූ කෲර පුත් කුමාරයෙක් සිටි බවත් පියා සමඟ යුද්ධයට ගිය ඔහු යුද්ධයේ අතිදක්ෂයෙකු බවත් පියා මරා රාජ්‍ය පාලනය සියතට ගත් බවත් එහි දැක්වේ. එමෙන්ම පීතෘඝාතක කර්මයෙන් මිදෙන්නේ කෙසේ දැයි සංඝයාගෙන් විමසූ බවත් සංඝයා ඔහුට ධර්ම දේශනා කළ ද ඉන් පලක් නොවූ හෙයින් ශිව ආගම වැලඳගත් බවත් සංඝයා මරවමින් ධර්ම පුස්තක ගිනි තබමින් ආරාම විනාශ කළ බවත් භීතිය හේතුවෙන් භික්ෂූන් සිවුරු හැර ගිය බවත් සමන්තකූටයෙහි ලාභය පාපකාරී මිථ්‍යාදෘෂ්ටික තවුසන්ට (ආඬින්ට) දුන් බවත් එහි වැඩිදුරටත් සඳහන් වේ. මෙලෙස මෙරට ප්‍රමුඛතම වංශකතාවට අනුව I රාජසිංහ යනු අතිශයින් කෲර පීතෘඝාතක බෞද්ධ විරෝධී මිථ්‍යාදෘෂ්ටික පාලකයෙකි. ජනප්‍රිය සහ අධිපති කතිකාව තුළ ස්ථාපිතව ඇති චිත්‍රය මෙයයි.

මෙම I වන රාජසිංහ චරිතය සහ එම පාලන සමය පදනම් කර ගෙන පද්මිනී සෙනෙවිරත්න තිවත නම් නවකතාව රචනා කරයි. මෙහිදී ඇය ෂ රාජසිංහ චරිතය දෙස විකල්ප දැක්මකින් ප්‍රවේශ වීමට උත්සාහ දරා ඇත. මේ සඳහා කතුවරිය සීතාවක මානියම්ගම විහාරවාසී සිටිනාමළුවේ ධම්මපාල හිමි විසින් රචිත ''සීතාවක රාජසිංහ රාජ්ජ කාලය'' නම් පුස්කොළ පිටපත ද මහාචාර්ය රිසිමන් අමරසිංහ ලියූ ''ඓතිහාසික සීතාවක'' නම් කෘතිය ද ඇසුරු කර ගනී. වඩාත් ප්‍රකට ආඛ්‍යානය වන්නේ I රාජසිංහ සහ බෞද්ධ භික්ෂූන් අතර පැවති ගැටුමයි. පද්මිනී සෙනෙවිරත්න තම නවකතාවේ දී ඊට වඩා වෙනස් ප්‍රවාදයක් පරිකල්පනය කරයි. ඇය මෙම ගැටුමට තුඩුදුන් පසුබිම පාඨකයාට නිරාවරණය කරයි. ඒ අනුව I රාජසිංහ සියලු භික්ෂූන් කෙරෙහි වෛරී සහ කෝපසහගත ක්‍රියාපිළිවෙතක් අනුගමනය කළ පුද්ගලයෙකු නොවේ. මෙහිදී රජුගේ වෛරයට පාත්‍ර වන්නේ ඔහුට එරෙහිව කන්ද උඩරට පාලකයන් සමඟ කුමන්ත්‍රණයේ යෙදුණු භික්ෂූන්ය. මේ ඇතැම් භික්ෂූන් ධර්ම පුස්තකවලට වඩා වෙනත් බඩු භාණ්ඩවලට ඇල්ම දැක්වූවෝ වෙති. තම වෛරයට පාත්‍ර වූ භික්ෂූන් කෙරෙහි ඔහු දැක්වූ ආකල්පය නවකතාවේ එන පහත දෙබස් ඛණ්ඩයෙන් පැහැදිලි වේ. එය ඔහු විසින් භික්ෂූන්ට පනවන ලද දඬුවම් සම්බන්ධ ප්‍රකාශයකි.

> ''මොකද, චීවරේ පිටින් දඬුකදේ ගහන්න කියලා විධානෙ දෙන්න කොපමණ කෝපයක් තිබුණත් සිත හදාග න්න අමාරුයි. නොදන්නා කමින් නොමග ගිය අයට කරුණු කාරණා තෝරලා දෙනවා විනා දඬුවම් දෙන්නෑ. හැබැයි දැන දැනම වැරදි කරලය කියලා ඔප්පු වුණොත් චීවරේය කියලා වැරැද්දට දඬුවම් නොදී ඉන්න පුළුවන් කමකුත් නෑ.''

(241 පි.)

එමෙන්ම ඉහතින්ද සඳහන් කළ පරිදි මහාවංශ කතුවරයාට අනුව I රාජසිංහ පීතෘ ඝාතකයෙකු ලෙසින් දැඩි ලෙස පළිගැනීමේ වුවමනාවෙන් ද පෙළුණු අයෙකි එහෙත් තිවත ප්‍රබන්ධයේ දී කතුවරිය මෙම අදහස ද අභියෝගයට ලක් කරයි. ඇය එසේ කරනුයේ හුදු ප්‍රබන්ධාත්මක සිතුවිල්ලක් ලෙස නොව පෙරකී සීතාවක රාජසිංහ රාජ්ජ කාලය පත් ඉරුව පදනම් කර ගෙනය. ඒ අනුව රාජසිංහ රජු මායාදුන්නේගේ පුතෙකු නොවන බව සීතාවක වැසියන් දනී. එය දෙවනගල රතනාලංකාර හිමි සහ විජේසුන්දර බණ්ඩාර විසින් පතුරවා හරින ලද මුසාවකි. තවද මෙම පත් ඉරුවට අනුව රාජසිංහ රජුගේ මෙම පළිගැනිමේ ක්‍රියාවලියට ප්‍රබල හේතුවක් තිබේ එනම් ඔහුගේ පුත් ධර්ම කුමාරයා පෘතුගීසීන් ලවා උපක්‍රමශීලීව මැරවීමට මෙම කුමන්ත්‍රණකරුවන්ගේ ක්‍රියා කිරීමය. මේ ආකාරයට තිවත නවකතාව වංශකතාවන්හි දැක්වෙන ඒකමානී ආඛ්‍යානය බහුමානී ආඛ්‍යානයක් වෙට විතැන් කිරීමට සමත්ව තිබේ. ඒ මගින් I රාජසිංහ පිළිබඳ ඉතිහාස කතිකාව වඩාත් පෝෂණය වී තිබේ.

ජනප්‍රිය කතිකාව තුළ ශ්‍රී ලාංකීය රාජවංශයේ වැඩි වශයෙන් ම අපවාදය ලක් වූ චරිතයක් ලෙස සීගිරි කාශ්‍යප නමින් ප්‍රකට I කාශ්‍යප රජු (ක්‍රි. ව. 473-491) හැඳින්විය හැකිය. මහාවංශය ඔහු දුෂ්ට පීතෘඝාතකයෙකු ලෙස හංවඩු ගසයි. ධාතුසේන රජු මරා දැමීමට ඔහු යොදාගත් ක්‍රමය මගින් කාශ්‍යපගේ දුෂ්ටත්වය තවදුරටත් තීව්‍ර කිරීමට මහාවංශ කතුවරයා වගබලා ගනී. මේ නිසාම සීගිරි කාශ්‍යප චරිතය ප්‍රබන්ධකරුවන්ගේ අවධානය වැඩි වශයෙන් දිනා ගැනීමට ද සමත්ව තිබේ. මහාවංශයට අනුව ධාතුසේන රජු හට කාශ්‍යප සහ මුගලන් යනුවෙන් පුතුන් දෙදෙනෙක් ද රූබර දියණියක් ද විය. කාශ්‍යප පිළිබඳ සඳහන් කිරීමේ දී මහාවංශය භින්නමාතෘක යන වදන් භාවිත කරයි. එයින් අදහස් වන්නේ සිය අන්තඃපුරයේ ප්‍රමුඛ මට්ටමේ බිසවකුගේ දරුවෙකු නොවන බවය. මුගලන් පිළිබඳ සඳහනේ දී ද තිබෙනුයේ සමාන මාතෘක මහබල ඇති යනුවෙනි. එමෙන්ම කාශ්‍යප චරිතයේ දුෂ්ටත්වය තහවුරු කිරීමට මහාවංශ කතුවරයා විවිධ නිශේධනාත්මක යෙදුම් භාවිත කරයි. ඒ අනුව ඔහු පාපකාරී යහලුවන් ඇසුරු කරන්නෙකි. එමෙන් ම නින්දිත කසුබ් රජු යන යෙදුමක් ද තිබේ. මෙහිදී මහාවංශය කාශ්‍යප රජු හඳුන්වාදීමට යොදන ප්‍රබල වදනක් වන්නේ ''පීතෘඝාතකයා'' යන්නය. මෙම හැඳින්වීම ජනප්‍රිය කතිකාව තුළ කෙතරම් දුරට තහවුරු වී ඇත් ද යත් කාශ්‍යප සහ පීතෘඝාතකයා යන්න පර්යාය පද ලෙස සැලකීමට හුරුව තිබේ. පොදු සමාජය තුළ මහාවංශය ගොඩ නංවන ලද ප්‍රවාදය අතිශය ප්‍රබල තත්ත්වයක පවතී. එමෙන්ම එය එකී ඝාතනයේ කුරිරුබව දැඩිව නිරූපණය වන ආකාරයටත් එය කියවන පාඨකයා තුළ කාශ්‍යප කෙරෙහි තදබල වෛරයක් ජනිතවන ආකාරයටත් ඉදිරිපත් කිරීමට මහාවංශ කතුවරයාට හැකිව තිබේ. එහි එම දසුන විස්තර වන්නේ මෙලෙසය.

> ''රජ තෙමේ ඒ දැක ඒකාන්තයෙන්ම අද (මා) මරවයි දනී එකල සහාසික
> ඒ තෙමේ රජහු නග්න කොට නැගෙණහිරට මුහණ ලා හැකිලී බැම්මෙන්
> බන්දවා ඇතුළු බිත්ති බිඳ මැටි ගැස්වී (39 පරි., 181 පි., 110-111)

මේ අනුව කාශ්‍යප සිය පියා ඝාතනය කර ඇත්තේ කලාවැවේ බිත්තියට තබා මැටි ගැසීමෙනි. සාමාන්‍ය ඝාතනයක් ඉක්මවා යන දරුණු ස්වරූපයක් ඊට එක් කර ඇති බව මෙයින් පැහැදිලි වේ. තවද, සම්ප්‍රදායට අනුව රාජ්‍යත්වය මුගලන්ට හිමිවිය යුතු වූව ද කාශ්‍යප එය කුමන්ත්‍රණකාරී ලෙස ලබා ගත් බව ද කියවේ.

මොහාන් රාජ් මඩවල විසින් රචිත 2021 වසරේ දී පළ වු නිල් කට්රොල් නවකතාව කාශ්‍යප පිළිබඳ වංශකතාමය ජනප්‍රිය කතිකාව පරිකල්පනාත්මකව ඉක්මවා යාමට උත්සාහ කරයි. මෙහිදී කතුවරයා ධාතුසේන සහ කාශ්‍යප අතර සබඳතාව ගැනත් කාශ්‍යප නැමති සංවිධාන ශක්තියෙන් සහ නිර්මාණාත්මක හැකියාවෙන් පිරිපුන් චරිතයක් ගොඩ නැංවීමට ඔහුගේ මව (උපුලි) දරන උත්සාහයත් කාශ්‍යප සතු ජනප්‍රසාදයත් ධාතුසේන රජුගේ මරණයත් පිළිබඳව විකල්ප දැක්මක් පාඨකයා වෙත සපයයි. නවකතාවේ දැක්වෙන ආකාරයට සීගිරිය උද්‍යානයේ ඉදිකිරීම් නිමවෙමින් පවතින අතරතුර ධාතුසේන රජු කාශ්‍යප සහ ඔහුගේ මව සමඟ එහි සංචාරයක නියැලෙයි. එහිදී කාශ්‍යප සමඟ කරන කතාබහෙන් අපමණ උද්දාමයට පත් වන රජු මෙවන් තීන්දුවක් එම මොහොතේ දීම නිවේදනය කරයි.

> ''තව සති තුනක ඇවෑමෙන් එලඹෙන නවම් මස පුරපසළොස්වක දින මේ ගල මුදුනත දී ම, මේ සිංහලද්විපයේ නව රජු ලෙස කාශ්‍යපගේ රාජාභිෂේකය සිදු කිරීමට මා නියෝග කළ බව නොපමාව සියලු රටවැසියන්ට දැනුම් දෙන්ඩ.... (නිල් කට්රොල්,
> 223 පි.)

මේ අනුව කාශ්‍යප යනු ධාතුසේන රජුගේ අගබිසවගේ දරුවෙකු නොවූව ද රජකම ඔහුට පැවරීමට තරම් සමීප හැඟීම්බර සබඳතාවක් ඔවුන් දෙදෙනා අතර තිබූ බවට නවකතාකරුවා පරිකල්පනය කරයි.

කතුවරයා කාශ්‍යප සහ ජනතාව අතර පැවතියේ යැයි අනුමාන කළ හැකි ශක්තිමත් සබඳතාව ගැන ද සිය අවධානය යොමු කරයි. ප්‍රබල ජනතා කැමැත්තකින් සහ සහයෝගයකින් තොරව හුදු රාජ නියෝග සහ බලහත්කාරී ශ්‍රමයක් මත මෙවන් දැවැන්ත සහ විස්මිත නිර්මාණයක් කිරීම උගහට බව මෙම ප්‍රබන්ධයේ යථාර්ථය මගින් නිරූපණය කෙරේ. ඉහත කී ධාතුසේනගේ සීගිරි සංචාරය අවස්ථාවේදී එතැනට රැස්ව සිටි අතිවිශාල ජනකාය දෙස බලා ඔහු මෙසේ විමසයි.

''ඇයි මේ තරම් පිරිසක්...? ''දේවයන් වහන්ස... මේ මිනිස්සු තමයි
මේ සියල්ල නිර්මාණය කළේ... ඒ තමයි කාශ්‍යපගේ සම්පත...''
කාගෙද මේ සංවිධාන ශක්තිය...''
එවිට කාශ්‍යප එයට පිළිතුරු දුන්නේය. ''අපි
ඔක්කොගෙම...'' (229 පි.)

එමෙන්ම මහානාම කතුවරයා වන මහානාම හිමි කාශ්‍යප කෙරෙහි මෙතරම් සතුරු ආකල්පයක් දැරීම ගැන ද සිය ප්‍රබන්ධ කතිකාව භාවිත කිරීමට නවකතාකරුවා ප්‍රයත්නයක යෙදෙයි. මෙම මහානාම හිමි ධාතුසේන රජුගේ ඥාතියෙකු වන අතර මහාවිහාර පාර්ශ්වයේ ප්‍රබලයෙකි. තවද ඔහු මුගලන් රජකමට පත් කිරීමට ඔහුගේ මව සමඟ සැලසුම් සකස් කරයි. කාශ්‍යප රජකමට පත් කිරීමට ධාතුසේන ගත්

තීරණය ගැන මහානාම හිමි දැඩි කෝපයට පත් වේ.

''මේක ඔබතුමියට විතරක් නොවෙයි මේ රටේ රාජ පරම්පරාවටම කරපු
අගෞරවයක්. ධාතුසේන එහෙම නින්දිත මිනිහෙක් වුණේ කොහොමද
කියලා මහා විහාරයේ අපට හිතා
ගන්නවත් බැහැ...... (224 පි.)

උන්වහන්සේ පිපිරෙන කෝපයෙන් යුතුව කේතකීට (මුගලන්ගේ මව) පැවසූහ. එවිට කේතකී තවත් අසරණ විය.

''දැන් අපි කුමක් ද කරන්නෙ හාමුදුරුවනේ...'' ''මේ වරද නිවැරදි
කරන්න කියලා මම නැවත ධාතුසේනට කතා කරන්නම්...''
''මහ රජ්ජුරුවො ඒ වරද නිවැරදි නොකළොත්...?'' ''එහෙම වුණොත්
එයාට විතරක් නොවේ, කාශ්‍යපටත් මේ රටේ ඉතිහාසය තුළ ලොකු
කැළලක් සිද්ධ වෙයි''(එම. 229,
230 පි.)

එමෙන්ම ධාතුසේන රජුගේ මරණය සිදු වූ ආකාරය පිළිබඳ ජනප්‍රිය කතිකාව අභියෝගයට ලක් කිරීමට නවකතාකරුවා සිය පරිකල්පනය මෙහෙයවයි. නවකතාවේ චරිත දෙකක් අතර සිදුවන දෙබසක දී මේ බව අනාවරණය වේ.

''ධාතුසේන රජුරුවො පණපිටින් පස් ගහලා
මැරුවේ කලා වැවේ බැම්මට නොවුණාට,
උන්නාන්සේ මියගියාම ඒ දේහය කාශ්‍යප කුමාරයා
ගෞරවනීය ලෙස ආදාහනය කළේ ඒ කලා වැවේ
බැම්මළඟ...'' (එම 270 පි.)

මෙයින් පෙනී යන්නේ නවකතාකරුවාගේ ආඛ්‍යානය තුළ කාශ්‍යප සහ එම යුගයේ සිදුවීම දෙස විකල්ප කියවීමක් වෙත යොමු වීමට අවකාශය පාඨකයාට හිමිවන බවය. එය පරිකල්පනීය ප්‍රයත්නයක් වුවද එයින් කතිකාව වඩාත් විචිත්‍රවත් කරන බව පැහැදිලිය.

සිංහල රාජාවලියේ සුවිශේෂ ස්ථානයක් හිමිවන රජෙකු ලෙස ෂෂ රාජසිංහ හැඳින්විය හැකිය. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට ලන්දේසීන් සමඟ එකඟතාවකට පැමිණීමට රජු තීරණය කළේය. ''ඉඟුරු දී මිරිස් ගත්තා වගේ'' යන ප්‍රස්ථා පිරුල බිහිවන්නේ මෙම සිද්ධිය මූලික කොට ගෙනය. ෂෂ රාජසිංහ පිළිබඳ දීර්ඝ විස්තරයක් මහාවංශයේ සඳහන් නොවේ. එම යුගය පිළිබඳ, සවිස්තරාත්මක මූලාශ්‍රයක් ලෙස රොබට් නොක්ස්ගේ එදා හෙළදිව කෘතිය භාවිත කළ හැකිය. මන්ද, රොබට් නොක්ස් සිරකරුවකු ලෙස උඩරට ප්‍රදේශයේ ගත කර ඇත්තේ මෙම කාලයේ දී බැවිනි. එම කෘතියේ පරිච්ඡේද තුනක් ම ඒ සඳහා වෙන් කර ඇත. නොක්ස් මෙහිදී රජුගේ රණකාමිත්වය, දක්ෂකම, දැඩි බව, ස්ත්‍රී ඇසුර ගැන සඳහන් කළ ද මූලික වශයෙන් ඔහු ප්‍රතිරූපණය කර ඇත්තේ අතිශය දරුණු සහ කෲර පාලකයෙකු ලෙසය. රජු සහ රජුගේ පුත්‍රයා සම්බන්ධව සිදු වීමක් නොක්ස් මෙසේ විස්තර කරයි.

''ඇතැම් අවස්ථාවල දී ආත්මාර්ථය සඳහා ඉතා දරුණු අපරාධ
කරන්නටත්, ජනතාව බිය වද්දන්නටත් හෙතෙම පසුබට නොවන්නේ
නොවේ. ස්වකීය පසළොස් හැවිරිදි කුමාරයා විනාශ කරන ලද්දේ
ආත්මාර්ථය නිසාමය'' (153 පි.)

මෙහිදී නොක්ස් වැඩිදුරටත් පවසන්නේ සිය පුතු කුමරාගේ වර්ධනය වන ජනප්‍රියත්වය නොඉවසූ රජු ඔහුට වසදී මියයාමට සැලැස්වූ බවය.

රජු දරුණු බව පෙන්වා දීමට යොදා ගන්නා තවත් සිදුවීමක් මෙම කෘතියේ සඳහන් වේ. වරෙක රජු ජල ස්නානය කරන අතරතුර තමන් දියේ ගිලෙන්නට යන බව ව්‍යාජ ලෙස හඟවා උපකාර ඉල්ලා කෑගසයි. එතැන සිටි තරුණයන් දෙදෙනෙක්

දියට පැන රජු බේරා ගනී. තමන්ගේ රාජකීය දේහයට අත තැබූ මෙම තරුණයන් දෙදෙනාගේ හිස ගසා දැමීමට රජු රාජපුරුෂයන්ට අණ කරයි.

මෙලෙස අධිපති ඉතිහාස කතිකාව තුළ රජුගේ සුරු විරුකම් අභිබවා කුරුරු බව මතුවේ. පද්මිනි සෙනෙවිරත්න විසින් රචිත 2023 ප්‍රකාශිත කඳුරැළි නවකතාව ෂෂ රාජසිංහ චරිතය සහ එම යුගය තේමා කොට ගත්තකි. මෙහිදී කතුවරිය උත්සාහ කරනුයේ ප්‍රධාන මූලාශ්‍රවල අවධානයට ලක් නොවූ රජුගේ චරිතයේ විවිධ පැතිකඩ නිරාවරණය කිරීමටය. ඒ අනුව ඇය විකල්ප මූලාශ්‍ර මෙන් ම සිංහල ජනකතා සහ ජනකවි ගණනාවක් භාවිත කරයි. ෂෂ රාජසිංහ රජුගේ ප්‍රධාන ගුණාංගයක් වන තරාතිරම නොබලා වරදට උපරිම දඬුවම් දීම ඔහු දරුණු සහ කුරිරු පාලකයෙකු ලෙස හංවඩු ගැසීමට හේතු වී ඇති බව පෙනේ. කතුවරිය ජනකතා සහ ජනකවි ඇසුරින් ප්‍රයත්න දරනුයේ මෙම එඩිතර, තේජවන්ත පුද්ගලයා තුළ සිටින ඉමහත් ජනාදරයට පත් ප්‍රේමාන්විත මිනිසා සොයා ගැනීමටය. ශ්‍රී රාජසිංහ වර්ණනාව නම් කාව්‍ය ග්‍රන්ථයට අනුව රජු භාෂා ගණනාවක ද වෙදකමෙහි ද ජ්‍යොතිෂ ශාස්ත්‍රයෙහි ද ප්‍රවීණයෙකු වූ බව මෙම නවකතාවේ පෙරවදනේ සඳහන් කර ඇත. ''රාසිං දෙයියෝ'' නමින් හැඳින්වීමට තරම් ඔහු ජනතාව අතර ආදරයට සහ ගෞරවයට පාත්‍රව තිබේ. මෙහිදී කතුවරියගේ අරමුණ වන්නේ සෙංකඩගල ෂෂ රාජසිංහ රජුගේ චරිතය සහ පාලන සමය පිළිබඳ ජනප්‍රිය මෙන් ම සාම්ප්‍රදායික කතිකාව ප්‍රබන්ධාත්මකව විනිවිදීමටය. ජනප්‍රිය කතිකාවට අනුව ෂෂ රාජසිංහ ආගම වෙත විශේෂ අනුග්‍රහයක් නොදැක්වූ ස්ත්‍රීලෝලයෙකි. මෙම නවකතාවේදී අපට සිංහල ජනතාවට අමතරව ඕලන්ද ජාතිකයන් ද මහමදිකයන් ද වැදි රැහේ සාමාජිකයන් ද මිශ්‍ර විවාහවල ප්‍රතිඵලයක් ලෙස බිහිවන පරපුරක් ද නිලධාරී තන්ත්‍රයේ විවිධ ධූරාවලි නියෝජනය කරන්නන් ද මුණ ගැසේ. මොවුන් එකිනෙකා සමඟ පවත්වන ඥාතිමය, රාජකාරිමය ප්‍රේමනීය සහ ශෘංගාරාත්මක සබඳතා දැක ගැනීමට අපට අවකාශ සැලසේ. මේ අනුව ඉතිහාසකරුවාට ස්පර්ශ කිරීමට අවසර නොමැති මානව සබඳතා සමඟ බැඳුණු ප්‍රේමනීය සහ ශෘංගාරාත්මක හැඟීම් පද්ධතියක් තුළ ෂෂ රාජසිංහ ස්ථාපිත කිරීමට නවකතාකරුවා සමත් වේ. එහෙත් මෙ හැඟීම කලාපයට සමාන්තරව බලය ක්‍රියාකරන ආකාරය ද නිරාවරණය කිරීමට කතුවරිය අමතක නොකරයි. බලය ව්‍යාප්ත කිරීමේ මග තහවුරු කිරීමේ මෙවලමක් ලෙස අන්තඃපුරය යොදා ගන්නා ආකාරයත් ඒ ඒ ජන කණ්ඩායම්වල සහ ප්‍රදේශවල සහාය ලබා ගැනීමට එහි පවත්නා උපයෝගීතාවත් කතාපුවත ඔස්සේ විද්‍යාමාන වීම ඊට නිදසුනකි. අනෙක් අතට ආගම සහ රාජ්‍ය පාලනය පිළිබඳ කතිකාව ද මෙම ප්‍රබන්ධයේ තවත් පැතිකඩක් නියෝජනය කරයි. කතුවරිය ෂෂ රාජසිංහ චිත්‍රණය කරනුයේ රාජ්‍ය පාලනය ලෞකික කාර්යයක් සේ සැලකූ පාලකයෙකු ලෙසිනි. ඒ අනුව ඔහු ආගම මෙන් ම පූජකයන් ද අතේ දුරින් තබාගත් පාලකයෙකි. ඉතිහාසය ප්‍රශ්න කිරීමකට වඩා ෂෂ රාජසිංහ චරිතය සහ ඔහුගේ ක්‍රියා කලාපය දෙස රොමෑන්තික බැල්මක් හෙලීමට දරන පරිකල්පනීය උත්සාහය මගින් ඉතිහාස කතිකාව පෝෂණය වන බව පැහැදිලි වේ.

සිංහලේ අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ ද විවාදාත්මක චරිතයක් ලෙස ඉතිහාස මූලාශ්‍රවල සටහන් වන්නෙකි. ඔහු ද ජනප්‍රිය නැතහොත් අධිපති කතිකාව තුළ ගොඩ නැංවී ඇත්තේ අසත්පුරුෂ සහ දරුණු පුද්ගලයෙකු ලෙසය. විශේෂයෙන් ඇහැලේපොල අදිකාරම් පවුල විනාශ කළ ආකාරය ගැන ඉතිහාසය ඔහු චූදිතයෙකු බවට පත් කරයි. ඔහු පිළිබඳ මහාවංශයේ සඳහන් වන්නේ මෙලෙසය.

> ''රාජාධිරජසිංහ රජුගේ බෑණා වූ ජනනායක තෙමෙ
> ශ්‍රී වික්‍රමරාජසිංහ යන නමින් ධෛර්ය ඇතිව රජවූයේ බුදුන් වදාළ ධර්මය අසා සතුටු විය. මිහිපල් තෙමේ දළදා වහන්සේට මිනිමුතු ආදිය ද එසේම නොයෙක් කෙත්ද පිදූ වූයේය. බුදුන් ප්‍රධාන සංඝයාට ප්‍රණීත ආහාර ද බොහෝවර දන් දී අනන්ත සම්පත් පැතුයේය. ඒ මිහිපල් තෙමේ මේ ආදිවූ බොහෝ කුසල් රැස් කෙළේය. (101 පරි., 399 පි., 20-22)

මෙයින් පෙනී යන්නේ මහාවංශයට අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ මුල දී දැහැමි සහ යහපත් පාලකයෙක් ලෙස කටයුතු කර ඇති බවය. අනතුරුව එහි දැක්වෙනුයේ පසුව අසත්පුරුෂ සමාගමයට පැමිණ විපර්යාසයට පත් වූයේය යනුවෙනි. මේ අනුව ඔහු දරුණු මනුෂ්‍ය ඝාතකයෙකු මෙන් ම මං පහරන්නෙකු බවට රූපාන්තරණය වී තිබේ. ඉන්පසු කුපිත වූ ජනයා රජු ඉංග්‍රීසින්ට හසු කර දී පිටුවහල් කරන්නට කටයුතු කර ඇත. මෙලෙස මෙරට නිල ඉතිහාසයවේදය තුළ ශ්‍රී වික්‍රම රාජසිංහ යනු යහපත් චරිතයක් නොවේ.

2010 දී ගොඩගේ ප්‍රකාශනයක් ලෙසින් ද 2023 විදර්ශන ප්‍රකාශනයක් ලෙසින් ද පළ වූ පද්මිණී සෙනෙවිරත්නගේ 'න ගච්ඡති' කෘතිය ශ්‍රී වික්‍රම රාජසිංහ චරිතය සහ එම යුගයේ සිදුවීම් පාදක කොට ගෙන රචිත නවකතාවකි. ඇය සිය ප්‍රබන්ධය ගොඩ නංවනුයේ ශ්‍රී වික්‍රම රාජසිංහ කෲර පාලකයෙකු බවට වන මතය රොබට් බ්‍රවුන්රිග් නම් ආණ්ඩුකාරයා විසින් ප්‍රචාරය කරන ලද ව්‍යාජයක් බවය. ඒ. සී. ලෝරි සහ පෝල් ඊ. පීරිස් වැනි විද්වතුන්ගේ කෘති ඇය තම පරිකල්පිත ප්‍රවාදය ගොඩ නැංවීම සඳහා යොදා ගනී. එම යුගයේ ස්ත්‍රී පුරුෂ සබඳතාවන්හි පැවති ලිබරල් ස්වරූපය ද එම කෘතිවලින් විදහා දැක්වේ. විශේෂයෙන් ජනප්‍රිය කතිකාව තුළ වඩාත් ප්‍රචලිත වන්නේ ඇහැලේපොල දරුවන්ගේ හිස් කෙටවීම ගැනය. පිරිමි දරුවන්ගේ හිස් ගසා දැමීමත් දියණිය වංගෙඩියක ලා කෙටීමට සැලැස්වීමත් පිළිබඳ විස්තය පොදු ජනසමාජය වර්තමානයේ පවා සසල කිරීමට සමත් සංසිද්ධියකි. න ගච්ඡති නවකතාවේ දී කතුවරිය පෙන්වා දෙන්නේ මෙය රජු සහ ජනතාව භේදභින්න කර බලය ලබා ගැනීමට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා විසින් ප්‍රබන්ධගත කරන ලද්දක් බවය.
මෙම නවකතාවේ චරිත දෙකක් අතර සිදුවන මෙම දෙබස් හුවමාරුව ඇහැලේපොළ පවුලට දඬුවම් දීම පිළිබඳ කතිකාව බහුමානී තලයකට ගෙන එයි.

'ඇහැලේපොලගෙ දරු පවුලට දඬුවම් දීම අසාධාරණයි කියලා ඔබට හිතෙන්නෙ නැද්ද?
''මහ නඩුව දීපු තීන්දුවක සාදාරණේ අසාදාරණේ ගැන කතා කරන්න මං කවුද? ඒකෙන් දෙන තීන්දු අනුමත කරන්න කලින් රජ්ජුරුවා පෙර සිරිත ගැනත් විමසලා තමයි අනුමැතිය දෙන්නෙ.'' (261 පි.)

මෙහිදී පෙර සිරිත ලෙස හඳුන්වන්නේ රාජද්‍රෝහී වීමට එරෙහිව දෙනු ලබන දඬුවමයි. එනම්, රජද්‍රෝහී වූ අයෙකුගේ මුළු පවුලටම දඬුවම් කිරීමය.

දරුවන්ගේ හිස් ගසා දැමීම සහ එම හිස් වංගෙඩියක දමා කෙටීම ගැන ද මෙවන් දෙබසක් නවකතාවේ සඳහන් වේ.
''මං අදහස් කළේ 'කුමාරිහාමි ඇහලේපොලගෙ දරුවන්ගේ හිස ගසා දාලා ඒ හිස් වංගෙඩියක දාලා කෙටෙව්වා කියන එක ගැන.''
'ඔය විස්තර කොතනක හරි ලියල තියෙනව සුද්දි කියවලා තියෙනවද?
''ඔව්''
''කවුද ලියලා තියෙන්නේ?
''ඩේවි කියන කෙනා. තව ෆෝබ්ස්. ඒ අයගේ පොත්වල තිබුණු විස්තර මං කියවලා තියෙනවා.
'ඒ උදවිය ඇසින් දැකල ද ඒවා ලියලා තියෙන්නේ? 'නැහැ''
එහෙනම් විස්තර කියපු අයගෙ නම්ගම් ඒ අය ලියල තියෙනවදා''
''ඒත් නැහැ'' (262 පි.)

ශ්‍රී වික්‍රම රාජසිංහ පිළිබඳ ජනප්‍රිය කතිකාව තුළ පවත්නා ඒකමානී ආකල්පය තනුක කිරීමට මෙම ප්‍රබන්ධය උත්සාහ දරා ඇති බව මෙයින් පැහැදිලිව පෙනේ. ඇහැලේපොළ කුමාරිහාමි රජුට අවනත නොවීම නිසා මෙම පළිගැනීම කළ බවට ද ජනප්‍රිය කතිකාවක සඳහනක් තිබේ. මේ ගැන විමසන අයෙකුට තවත් කෙනෙක් මෙවන් පිළිතුරක් සපයයි.
''රජ්ජුරුවො කුරිරුයි . කුමාරිහාමිව යහනට ගෙන්නවා ගන්නවාය කියන එක ඒ හැටි දෙයක් ද?ෟ ඒකට මොකටද කුමාරිහාමිගෙ කැමැත්තක්''
(264 පි.)

**සමාලෝචනය**

නිර්මාල් රංජිත් දේවසිරි විසින් රචිත ලංකාවේ ඉතිහාසය දෘෂ්ටිවාදී විචාරයක් යන ග්‍රන්ථයට පෙරවදනක් ලියන ජයදේව උයන්ගොඩ මෙසේ පවසයි. 'ඉතිහාසය යන්න ශාස්ත්‍රාලීය ඉතිහාසයන්ට පමණක් හිමි ක්ෂේත්‍රයක් නොව ඉතිහාසයන්ගේ ශාස්ත්‍රීය ග්‍රහණයෙන් මිදී සමාජයේ කණ්ඩායම් ගණනාවක් විසින්ම හිමිකම් කියාපානු ලබන ඥාන ක්ෂේත්‍රයකි. (ංංස පි.) ඉතිහාසවේදයේ මෙම ආකෘතිය හරහා අධිපති සමාජ ඥානයක් නිර්මාණය කරන බවත් එමගින් අප්‍රකාශිත ඥානයේ සාංදෘෂ්ටික අභිංසකත්වය අහිමි කරන බවත් ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි. මෙයින් පැහැදිලි වන්නේ මෙම අධිපති කතිකාව ඒකමානී ඉතිහාසවේදයක් නිර්මාණය කරන බවය. එය ජනප්‍රිය කතිකාව බවට පත් වූ විට එකී අධිපති බව තවදුරටත් තීව්‍ර වේ. එහෙත් ඉතිහාස කතිකාව වඩාත් විචිත්‍රවත් වීමට ඒ පිළිබඳ බහුමානී කතිකාවක් අවශ්‍ය වේ. එය ඇතැම් විටෙක ඉතිහාසවේදය තුළම ගොඩ නැංවේ. එහෙත් එයට අවකාශ සැලසෙනුයේ සීමිත වශයෙනි. ප්‍රබන්ධය මෙම සීමිත බව අතික්‍රමණය කිරීමට පවත්නා ප්‍රබල අඩවියකි. ''දැනුම සීමිතය. පරිකල්පනය අසීමිතය යනුවෙන් වරෙක ඇල්බට් අයින්ස්ටයින් පැවසුවේ එහෙයිනි. මේ අනුව ඉතිහාස කතිකාව පෝෂණය වීමටත් විචිත්‍රවත් වීමටත් ඉතිහාස දැනුමේ සහ ඉතිහාස ප්‍රබන්ධයේ සමෝධානය අවශ්‍ය වේ.

ලංකා ඉතිහාසය පිළිබඳ ප්‍රධානතම ලිඛිත මූලාශ්‍රය ලෙස සැලකෙන මහාවංශයේ ඇතැම් රජවරුන් සහ ඔවුන්ගේ රාජ්‍ය සමයන් ගැන සඳහන් තොරතුරු සමග ඓතිහාසික ප්‍රබන්ධ තුළ ගොඩ නැංවෙන පරිකල්පනාත්මක ඉතිහාසය යුගලනය කිරීම මගින් වඩාත් පුළුල් ඉතිහාසාත්මක අවකාශයක් විවර වන බව පැහැදිලිය. මහාවිහාර සම්ප්‍රදාය සමඟ සමීප සබඳතාවක් පවත්වා ගෙන යාම මගින් මහාවංශය සතුව දෘෂ්ටිවාදී ස්ථාවරයක් පවත්නා බව විද්‍යමාන වේ. මහාවිහාරයට අනුග්‍රහය දැක්වූ රජවරුන්ගේ ක්‍රියාකලාප උත්කර්ශයට නැංවීමත් එසේ නොකළ සහ ඊට විරුද්ධවාදී ස්ථාවරයක් දැරූ රජවරුන් හෝ රැජිණියන් දුෂ්ටයන් බවට පත් කිරීමත් නොසලකා හැරීමත් සිදු වන්නේ එහෙයිනි. ඇතැම් විට මේ සඳහා ප්‍රබන්ධගත තොරතුරු ඉදිරිපත් කිරීමට වංශකතාකරුවන්ට සිදු වේ. මන්ද, ඔවුනට තම දෘෂ්ටිවාදය තහවුරු කිරීමට සිදු වන බැවිනි. මේ නිසා අපට සත්‍ය යැයි පිළිගැනීමට සලස්වන දෙය සත්‍යයට වඩා ප්‍රබන්ධයක් විය හැකිය. ඓතිහාසික නවකතාකරණයේ නියැලෙන ප්‍රබන්ධකරුවා බොහෝ විට උත්සාහ කරනුයේ එම ඓතිහාසික මූලාශ්‍රවල පවත්නා ප්‍රබන්ධමය නිමේෂයන්හි යථාර්ථය පරිකල්පනාත්මකව සොයා යාමටය. එමෙන්ම නවකතාකරුවා වින්‍යාසගත කරන ප්‍රබන්ධයේ යථාර්ථය ඇතැම් විට ඓතිහාසික මූලාශ්‍රමය යථාර්ථය ඉක්මවා යන යථාර්ථයක් විය හැකිය.

ඉහත සාකච්ඡාවට බඳුන් කළ නවකතා සියල්ලේ ම දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ ඉතිහාසයේ චරිත සහ සංසිද්ධි වංශකතාමය දෘෂ්ටිවාදයෙන් පරිබාහිර තලයක ස්ථානගත කිරීම වේ. මේ අනුව අනුලා රැජින, I කාශ්‍යප, I රාජසිංහ, 11 රාජසිංහ සහ ශ්‍රී වික්‍රම රාජසිංහ පිළිබඳ වංශකතා පාදක අධිපති හා ජනප්‍රිය කතිකාවේ ඒකමානි ස්වරූපය බහුමානී තලයකට ගෙන ඒමට ප්‍රබන්ධකරුවා සමත්ව ඇති බව පෙනේ. ප්‍රබන්ධකරුවා මෙම නිර්මිතිය හැඩගස්වනුයේ හුදු හිතලු ලෙසින්ම නොවේ. ඔහු/ඇය සිය ප්‍රබන්ධය ගොඩනංවනුයේ ලිඛිත හෝ අලිඛිත විකල්ප මූලාශ්‍ර භාවිත කරමිනි. ඔවුන්

තම ප්‍රබන්ධය තුළ යථාර්ථයක් පවත්වා ගෙන යයි. මේ අනුව ප්‍රබන්ධකරුවා උත්සාහ ගෙන ඇත්තේ ඓතිහාසික මූලාශ්‍රයන්හි සත්‍ය අසත්‍ය බව විමසීමට නොවේ. එය ඉතිහාසඥයාගේ කාර්යයකි. එහෙත් මෙම ඓතිහාසික ප්‍රබන්ධයේ දී සිදු වන්නේ ඉතිහාසඥයාට හෝ ඓතිහාසික මූලාශ්‍රවලට අභියෝග කිරීම නොව ඉතිහාසය කතිකාව වාස්තවික සාධකවලින් ඔබ්බට ගෙන යාමය. නැතහොත් ඉතිහාසඥයාට වරම් නොමැති, ඓතිහාසික චරිතවල ආත්මීය හා චිත්තවේගී පාර්ශ්ව ස්පර්ශ කරමින් ඉතිහාසයේ චූල ආඛ්‍යාන පෙරබිමට ගෙන ඒමය. ඉතිහාස කතිකාව සම්පූර්ණ වන්නේ වාස්තවික මෙන් ම ආත්මීය පාර්ශ්වයන්ගේ ධනාත්මක සංකලනයෙනි. මේ අනුව ඉහත සඳහන් කළ ඓතිහාසික නවකතාවල අවධානයට යොමු වන චරිත ආත්මීයව කියවා ගැනීමට එකී පරිකල්පනීය උත්සාහයන් මහෝපකාරී වන බව මැනවින් පැහැදිලි වේ. එය නියත ලෙසම ඉතිහාස කතිකාව පෝෂණය කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Barthes, Roland (1981). Critical essays. Northesestern University Press. London

Carr, G. H. (2008). What is history . 2nd print. Pelicon. London

De Certeau, Michel (1988). The writing of history. Columbia University Press. New York

De Coulanges (1954). Historical thoughts. ed. by Jane Herrick. Catholic University of America Press. Washington.

Foucault, Michel (1980). Power / Knowledge : selected interviews and other writings 1972-77. Pantheon Books. NewYork

Jenkins, Keth (1995). What is history : from Carr and Elton to Roity and White Routledge. London

දේවසිරි, නිර්මාල් රංජිත් (2019). ලංකාවේ ඉතිහාසය ඃ දෘෂ්ටිවාදී විචාරයක්. විදර්ශන. කළුබෝවිල නොක්ස්, රොබට් (2015) එදා හෙළදිව. පරි. ඩේවිඩ් කරුණාරත්න. එම්. ඩී. ගුණසේන. කොළඹ මඩවල, මොහාන් රාජ් (2016). ඍජින. බිසෝ ප්‍රකාශන. නුගේගොඩ

මඩවල, මොහාන් රාජ් (2021). නිල්කට්රොල්. බිසෝ ප්‍රකාශන. නුගේගොඩ

මහාවංශය. (1996). සංස්කරණය හික්කඩුවේ සුමංගල හිමි. එස්. ගොඩගේ. කොළඹ

සෙනෙවිරත්න, පද්මිනි (2016). න ගච්ඡති. විදර්ශන. කළුබෝවිල

සෙනෙවිරත්න, පද්මිනි (2019). තිවත. විදර්ශන. කළුබෝවිල

සෙනෙවිරත්න, පද්මිනි (2023). කඳුරැළි. විදර්ශන. කළුබෝවිල